# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,769—1961 නොවැම්බර් 11 වැනි සෙනසුරාදා—11.11.1961**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන

### ප්‍රකාශනයයි

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 64/61 (8).

අති සම්භාවණීය ශාන්ත මයිකල් හා ශාන්ත ජෝර්ජ් සමයානුගත උත්තම කුරුසියේ නයිට් පදවිය, රාජකීය වික්ටෝරියානු පරිපාටියෙහි නයිට් විධායක පදවිය හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අති උත්තම විධායක නයිට් පදවිධාරී වූ ශ්‍රී ලංකාද්වීපයේ හා තදීය යටත් දේශයන්ගේ අග්‍රාණ්ඩුකාර හා සේනාධිනායක ධූරිණී සර් ඔලිවර් අර්නස්ට් ගුණතිලක උතුමාණන් වහන්සේ විසිනි.

ඕ. ඊ. ගුණතිලක.

මුද්‍රාව

1961 නොවැම්බර් එකොළොස් වැනි දින 1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥා පනතෙහි II වෙනි කොටසෙහි විධිවිධාන ක්‍රියාත්මක විය යුතුය යි ප්‍රකාශ කෙරෙන (මින්මතු ''හදිසි ප්‍රකාශනය'' ය යි සඳහන් කරනු ලබන) ප්‍රකාශනයක් ඒ ආඥා පනතෙහි 2 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ කරනු ලැබ, 1961 නොවැම්බර් එකොළොස් වැනි දිනය හා අංක 12,747 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ හෙයින් ද ;

ඉහත කී ආඥාපනතෙහි 2 වෙනි වගන්තියේ (3) වෙනි උප වගන්තිය අනුව හදිසි ප්‍රකාශනය පාර්ලිමේන්තුවට දන්වා සිටීමට අවස්ථාවක් අවශ්‍යවන හෙයින් ද ;

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය දස දිනක් ඇතුලත අවසන් නොවන අන්දමේ අඩාළව කල් දැමීමක් අනුව, පාර්ලිමේන්තුව රැස් නොවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ඉහත කී ආඥාපනතෙහි 2 වෙනි වගන්තියෙහි (3) වෙනි උප වගන්තියෙන් නියමිත පරිදි, දස දිනක් ඇතුළත නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීමක් සඳහා ප්‍රකාශනයක් නිකුත් කළයුතු හෙයින් ද ;

1949 අංක 22 දරන පනතින් සංශෝධිත ඉහත කී ආඥාපනතෙහි 2 වෙනි වගන්තියෙහි (3) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාණ්ඩුකාර, ඔලිවර් අර්නස්ට් ගුණතිලක වන මා, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හදිසි ප්‍රකාශනය දන්විය හැකි අවස්ථාවක් සැලැස්වීම පිණිස, 1961 නොවැම්බර් දහහත් වැනි දින පූර්ව භාග 10.00 ට රැස්වන ලෙස නියෝජිත මන්ත්‍රී මණ්ඩලය, මේ ප්‍රකාශනයෙන් කැඳවන බව දැනගත යුතුය.

එක්වාදහස් නවසිය හැටඑකක් වූ නොවැම්බර් එකොළොස් වැනි දින මෙම දිවයිනේ මුද්‍රාව යටතේ කොළඹ දී ප්‍රකාශ කරන ලදී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි ''ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්'' හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.

2053—ජේ. ඇන්. ආර් 20341—5,400 (10/61)